IslamHouse.com

56 සූරා අල් වාකිඅහ්

(නියත සිදුවීම)

ආයත් 1-96 දක්වා.

අල් කුර්ආනය

< Sinhala>

සිංහල

මාහිර් රම්ඩීන්
පරිවර්තක

ඉස්ලාම් හවුස් වෙබ් අඩවියේ සංස්කරණ මණ්ඩලය

විචාරය කිරීම

ترجمة معاني القرآن الكريم

سورة الواقعة - 56

القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد ونخبة من العلماء الكرام

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126
OFFICERABWAH

56 සූරත් අල්-වාකිඅහ් (නියත සිදුවීම)

මක්කාවෙහි දී හෙළිදරව් කෙරුණකි.

ආයාත් (වැකි) 96 කි.

بِسْمِ اللّٰهِ الرَّحْمنِ الرَّحِيْمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

1-14 මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය කෙසේද?

إِذَا وَقَعَتِ الْوَاقِعَةُ {1}

සිදු වන දෑ සිදු වූ විට

لَيْسَ لِوَقْعَتِهَا كَاذِبَةٌ {2}

එම සිදුවීම බොරුවක් නොවෙයි.

خَافِضَةٌ رَافِعَةٌ {3}

(එය අපරාධකරුවන්) පහත් කරවන්නකි. (දැහැමියන්) උසස් කරවන්නකි.

إِذَا رُجَّتِ الْأَرْضُ رَجًّا {4}

මහපොළොව කම්පනයකින් කම්පනය කරනු ලැබූ විට

وَبُسَّتِ الْجِبَالُ بَسًّا {5}

තවද කඳු සුනු විසුනු කිරීමෙන් සුනු විසුනු කරනු ලැබූ විට

فَكَانَتْ هَبَاءً مُنْبَثًّا {6}

එවිට එය විසිරුණු දූවිලි බවට පත් වනු ඇත.

وَكُنْتُمْ أَزْوَاجًا ثَلَاثَةً {7}

එවිට නුඹලා වර්ග තුනක් වන්නෙහුය.

فَأَصْحَابُ الْمَيْمَنَةِ مَا أَصْحَابُ الْمَيْمَنَةِ {8}

එනම් දකුණු පසට වූ ජනයා. එම දකුණු පසට වූ ජනයා යනු කවරෙක් ද?

وَأَصْحَابُ الْمَشْأَمَةِ مَا أَصْحَابُ الْمَشْأَمَةِ {9}

තවද වම් පසට වූ ජනයා. එම වම් පසට වූ ජනයා යනු කවරෙක් ද?

وَالسَّابِقُونَ السَّابِقُونَ {10}	පෙරටුගාමීහු පෙරටු ගාමීහුය.
أُولَٰئِكَ الْمُقَرَّبُونَ {11}	ඔවුහු (අල්ලාහ්ට) සමීපතයෝ වෙති.
فِي جَنَّاتِ النَّعِيمِ {12}	(ඔවුන්) සැපවත් උයන්හිය.
ثُلَّةٌ مِنَ الْأَوَّلِينَ {13}	මුල් අයගෙන් වූ පිරිසකි.
وَقَلِيلٌ مِنَ الْآخِرِينَ {14}	තවද පසු පැවත එන්නන්ගෙන් වූ ස්වල්පයකි.

15-26 ස්වර්ගවාසීන්ට හිමි සැප පහසුකම්

عَلَىٰ سُرُرٍ مَوْضُونَةٍ {15}	(ඔවුන්) අලංකාර කරන ලද කවිච්චි මතය.
مُتَّكِئِينَ عَلَيْهَا مُتَقَابِلِينَ {16}	ඒ මත එකිනෙකාට මුහුණලමින් හාන්සිවන්නන් ලෙස සිටිති.
يَطُوفُ عَلَيْهِمْ وِلْدَانٌ مُخَلَّدُونَ {17}	ළමා විය සදාතනික වූ ළමුන් ඔවුන් වටා යති.
بِأَكْوَابٍ وَأَبَارِيقَ وَكَأْسٍ مِنْ مَعِينٍ {18}	දිය දහරාවෙන් පුරවනු ලැබූ ගුරු ලේත්තු, කේතල් හා කුසලාන සමග (ඔවුන් වටා යති.)
لَا يُصَدَّعُونَ عَنْهَا وَلَا يُنْزِفُونَ {19}	එයින් ඔවුනට හිසේ රුදාව ඇති නොවේ. තවද ඔවුන් මත් නොවෙති.
وَفَاكِهَةٍ مِمَّا يَتَخَيَّرُونَ {20}	ඔවුන් තෝරා ගන්නා පරිදි පලතුරු සමග
وَلَحْمِ طَيْرٍ مِمَّا يَشْتَهُونَ {21}	ඔවුන් ආශා කරන පරිදි කුරුලු මාංශ සමග

තවද දැකුම්කලු කන්‍යා කුමරියෝ ද වෙති.	وَحُورٌ عِينٌ {22}
(ඔවුන්) සඟවා තබන ලද මුතු වලට සමානය	كَأَمْثَالِ اللُّؤْلُؤِ الْمَكْنُونِ {23}
ඔවුන් (මොලොවෙහි) සිදු කරමින් සිටි දෑ සඳහා ප්‍රතිඵලයක් වශයෙනි.	جَزَاءً بِمَا كَانُوا يَعْمَلُونَ {24}
ඔවුහු එහි පුහු දැයකට හෝ පාපය ඇති කරන කතාවකට හෝ සවන් නොදෙති.	لَا يَسْمَعُونَ فِيهَا لَغْوًا وَلَا تَأْثِيمًا {25}
ශාන්තියයි ශාන්තියයි යනුවෙන් පවසනු ලැබීම මිස. (වෙන කිසිවකට සවන් නොදෙති.)	إِلَّا قِيلًا سَلَامًا سَلَامًا {26}

27-40 දකුණුපස ජනයාට හිමි සැප පහසුකම්.

දකුණු පස ජනයා, දකුණු පස ජනයා යනු කවරෙක් ද?	وَأَصْحَابُ الْيَمِينِ مَا أَصْحَابُ الْيَمِينِ {27}
(ඔවුන්) කටු නොමැති මසන් ගස් අතරෙහිය.	فِي سِدْرٍ مَخْضُودٍ {28}
තවද කැන් එල්ලෙන කෙසෙල් ගස් අතරය.	وَطَلْحٍ مَنْضُودٍ {29}
දිගු කරනු ලැබූ සෙවණැලි අතරය	وَظِلٍّ مَمْدُودٍ {30}
ගලා යවනු ලබන ජලය අතරය.	وَمَاءٍ مَسْكُوبٍ {31}
බොහෝ පලතුරු අතරය.	وَفَاكِهَةٍ كَثِيرَةٍ {32}
කිසිදු කප්පාදුවක් නැත. එමෙන්ම කිසිදු තහනම් කිරීමක් ද නැත.	لَا مَقْطُوعَةٍ وَلَا مَمْنُوعَةٍ {33}

وَفُرُشٍ مَرْفُوعَةٍ {34}

උස් ව තබන ලද ඇතිරිලි අතරය.

إِنَّا أَنْشَأْنَاهُنَّ إِنْشَاءً {35}

නියත වශයෙන්ම අපි ඔවුන් (අලංකාර) නිර්මාණයකින් නිර්මාණය කළෙමු.

فَجَعَلْنَاهُنَّ أَبْكَارًا {36} عُرُبًا أَتْرَابًا {37}

එවිට අපි ඔවුන් පෙම්බර සම වයසැති කන්‍යා කුමරියන් බවට පත් කළෙමු.

لِأَصْحَابِ الْيَمِينِ {38}

දකුණු පස ජනයා සඳහා (මේවා සූදානම් කර තිබේ.)

ثُلَّةٌ مِنَ الْأَوَّلِينَ {39}

(ඔවුන්) මුල් අයගෙන් වූ පිරිසකි

وَثُلَّةٌ مِنَ الْآخِرِينَ {40}

තවද පසු පැවත එන්නන්ගෙන් වූ පිරිසකි.

41-56 වම්පස ජනයාට හිමි දඬුවම කෙසේද?.

وَأَصْحَابُ الشِّمَالِ مَا أَصْحَابُ الشِّمَالِ {41}

තවද වම් පස ජනයා. වම් පස ජනයා යනු කවරෙක් ද?

فِي سَمُومٍ وَحَمِيمٍ {42}

(ඔවුන්) ලෝ දිය හා ගිනි දැලි සුළං අතරය.

وَظِلٍّ مِنْ يَحْمُومٍ {43}

කළු දුමාරයෙන් යුත් සෙවණ අතරය.

لَا بَارِدٍ وَلَا كَرِيمٍ {44}

තවද (එහි) කිසිදු සිසිලක් හෝ අලංකාර දර්ශනයක් හෝ නැත.

إِنَّهُمْ كَانُوا قَبْلَ ذَٰلِكَ مُتْرَفِينَ {45}

නියත වශයෙන්ම ඔවුහු එයට පෙර (මෙලොවෙහි) සැප විඳින්නන් ලෙස සිටියහ.

وَكَانُوا يُصِرُّونَ عَلَى الْحِنْثِ الْعَظِيمِ {46}	තවද ඔවුහු මහත් පාපයන් මත හිතුවක්කාර ලෙස රැඳී සිටින්නන් වූහ.
وَكَانُوا يَقُولُونَ أَئِذَا مِتْنَا وَكُنَّا تُرَابًا وَعِظَامًا أَإِنَّا لَمَبْعُوثُونَ {47}	තවද "අපි මිය ගොස් පස් හා අස්ථි බවට පත් වූ පසු නියත වශයෙන්ම අපි නැවත නැගිටුවනු ලබන්නෝ වෙමු දැ" යි ඔවුහු පවසමින් සිටියහ.
أَوَآبَاؤُنَا الْأَوَّلُونَ {48}	"අපගේ මුලාරම්භක මුතුන් මිත්තන් ද?"
قُلْ إِنَّ الْأَوَّلِينَ وَالْآخِرِينَ {49} لَمَجْمُوعُونَ إِلَىٰ مِيقَاتِ يَوْمٍ مَعْلُومٍ {50}	"නියත වශයෙන්ම මුලාරම්භකයින් හා පසු පැවත එන්නන් (යන සියල්ල) නියමිත දිනක නියමිත වේලාවක එක් රැස් කරනු ලබන්නෝ වෙති" යැයි (නබිවරය) නුඹ පවසනු.
ثُمَّ إِنَّكُمْ أَيُّهَا الضَّالُّونَ الْمُكَذِّبُونَ {51} لَآكِلُونَ مِنْ شَجَرٍ مِنْ زَقُّومٍ {52}	අහෝ බොරුකාර නොමග ගියවුනි! අනතුරු ව නියත වශයෙන්ම නුඹලා ᶻසක්කූම් ගසින් අනුභව කරන්නෝ වෙති.
فَمَالِئُونَ مِنْهَا الْبُطُونَ {53}	එවිට එයින් කුසවල් පුරවා ගන්නෝ වෙති.
فَشَارِبُونَ عَلَيْهِ مِنَ الْحَمِيمِ {54}	ඒ මත ලෝ දියෙන් පානය කරන්නෝ වෙති.
فَشَارِبُونَ شُرْبَ الْهِيمِ {55}	පිපාසිත ඔටුවන් පානය කරන්නාක් මෙන් පානය කරන්නෝ වෙති.
هَٰذَا نُزُلُهُمْ يَوْمَ الدِّينِ {56}	මෙය විනිශ්චය දිනයේ ඔවුන්ගේ සංග්‍රහය වේ.

57-74 නැවත නැගිටුවා විනිශ්චය කිරීමේ අල්ලාහ්ගේ බලය සහ මහිමය නිරූපණය කරන අල්ලාහ්ගේ වස්තූන්.

نَحْنُ خَلَقْنَاكُمْ فَلَوْلَا تُصَدِّقُونَ {57}	අපය නුඹලා ව මැව්වේ. එහෙයින් නුඹලා සත්‍යය කළ යුතු නොවේ ද?
أَفَرَأَيْتُمْ مَا تُمْنُونَ {58}	නුඹලා ශුක්‍රාණු ලෙස පිට කරන දෑ ගැන නුඹලා සිතා බැලුවෙහු ද?
أَأَنْتُمْ تَخْلُقُونَهُ أَمْ نَحْنُ الْخَالِقُونَ {59}	එය මැව්වේ නුඹලා ද එසේ නැතහොත් (එහි) මැවුම්කරුවෝ වන්නේ අප ද?
نَحْنُ قَدَّرْنَا بَيْنَكُمُ الْمَوْتَ وَمَا نَحْنُ بِمَسْبُوقِينَ {60} عَلَىٰ أَنْ نُبَدِّلَ أَمْثَالَكُمْ وَنُنْشِئَكُمْ فِي مَا لَا تَعْلَمُونَ {61}	නුඹලා අතර මරණය නිර්ණය කළේ අපය. නුඹලාගේ හැඩරුව වෙනස් කිරීමටත් නුඹලා නොදන්නා ස්වරූපයක නුඹලා ව (යළි) බිහි කිරීමටත් අපි අසරණයින් නොවෙමු.
وَلَقَدْ عَلِمْتُمُ النَّشْأَةَ الْأُولَىٰ فَلَوْلَا تَذَكَّرُونَ {62}	තවද මුල් මැවීම ගැන සැබැවින්ම නුඹලා දන්නෙහුය. එහෙයින් නුඹලා මෙනෙහි කළ යුතු නොවේ ද?
أَفَرَأَيْتُمْ مَا تَحْرُثُونَ {63}	නුඹලා වපුරන දෑ ගැන නුඹලා සිතා බැලුවෙහු ද?
أَأَنْتُمْ تَزْرَعُونَهُ أَمْ نَحْنُ الزَّارِعُونَ {64}	එය වගා කරනුයේ නුඹලා ද? එසේ නැතහොත් (එහි) වගාකරුවෝ අප ද?
لَوْ نَشَاءُ لَجَعَلْنَاهُ حُطَامًا فَظَلْتُمْ تَفَكَّهُونَ {65}	අපි අභිමත කරන්නේ නම් එය වියැළුණු ඉපැණිලි බවට පත් කරන්නට තිබුණි. එවිට නුඹලා පුදුමයට පත් වනු ඇත.

إِنَّا لَمُغْرَمُونَ {66}	“නියත වශයෙන්ම අපි ණය කාරයෝ වෙමු.”
بَلْ نَحْنُ مَحْرُومُونَ {67}	“එසේ නොව අපි වළක්වනු ලැබූවෝ වෙමු.” (යැයි පවසති)
أَفَرَأَيْتُمُ الْمَاءَ الَّذِي تَشْرَبُونَ {68}	නුඹලා පානය කරන ජලය දෙස නුඹලා නිරීක්ෂා කොට බැලුවෙහු ද?
أَأَنْتُمْ أَنْزَلْتُمُوهُ مِنَ الْمُزْنِ أَمْ نَحْنُ الْمُنْزِلُونَ {69}	එය වලාකුළෙන් පහළ කළේ නුඹලා ද? එසේ නැතහොත් (එය) පහළ කරන්නෝ අපද?
لَوْ نَشَاءُ جَعَلْنَاهُ أُجَاجًا فَلَوْلَا تَشْكُرُونَ {70}	අපි අභිමත කර ඇත්නම් එය ලුණු බවට පත් කරන්නට තිබුණි. එහෙයින් නුඹලා ගුණගරුක විය යුතු නොවේ ද?
أَفَرَأَيْتُمُ النَّارَ الَّتِي تُورُونَ {71}	නුඹලා දල්වන ගින්න විමසිල්ලෙන් බැලුවෙහු ද?
أَأَنْتُمْ أَنْشَأْتُمْ شَجَرَتَهَا أَمْ نَحْنُ الْمُنْشِئُونَ {72}	එහි ගස නිර්මාණය කළේ නුඹලා ද? එසේ නැතහොත් (එහි) නිර්මාණකරුවෝ අප ද?
نَحْنُ جَعَلْنَاهَا تَذْكِرَةً وَمَتَاعًا لِلْمُقْوِينَ {73}	අපි එය මෙනෙහි කිරීමක් ලෙසින් හා මගී(අවශ්‍යතා ඇත්ත)න්ට භාණ්ඩයක් ලෙසින් අපි එය පත් කළෙමු.
فَسَبِّحْ بِاسْمِ رَبِّكَ الْعَظِيمِ {74}	එහෙයින් නුඹගේ අති මහත් පරමාධිපතියාණන්ගේ නාමයෙන් නුඹ සුවිශුද්ධ කරනු.

75-87 අල්කුර්ආනයේ මහිමය සහ එය බොරු කරන්නන්හට කෙරෙන අවවාදය.

فَلَا أُقْسِمُ بِمَوَاقِعِ النُّجُومِ {75}

එහෙයින් තාරකා රැඳෙන තැන් මත මම දිවුරමි.

وَإِنَّهُ لَقَسَمٌ لَوْ تَعْلَمُونَ عَظِيمٌ {76}

තවද නුඹලා දන්නෙහු නම් නියත වශයෙන්ම එය ඉමහත් දිවුරුමකි.

إِنَّهُ لَقُرْآنٌ كَرِيمٌ {77}

නියත වශයෙන්ම එය ගෞරවනීය කුර්ආනයකි.

فِي كِتَابٍ مَكْنُونٍ {78}

ආරක්ෂා කරනු ලැබූ ලේඛනයෙහිය.

لَا يَمَسُّهُ إِلَّا الْمُطَهَّرُونَ {79}

එය පිවිතුරු අය හැර වෙනත් කිසිවකු ස්පර්ශ නොකරති.

تَنْزِيلٌ مِنْ رَبِّ الْعَالَمِينَ {80}

ලෝවැසියන්ගේ පරමාධිපතිගෙන් වූ පහළ කිරීමකි.

أَفَبِهَٰذَا الْحَدِيثِ أَنْتُمْ مُدْهِنُونَ {81}

නුඹලා මෙම ප්‍රකාශය ගැන ද නොසලකා හරින්නන් ලෙස සිටිනුයේ එහෙයින් ද?

وَتَجْعَلُونَ رِزْقَكُمْ أَنَّكُمْ تُكَذِّبُونَ {82}

තවද නුඹලාගේ පෝෂණය සඳහා (කෘතගුණ සලකන්නක් ලෙස) නියත වශයෙන්ම නුඹලා බොරු කිරීම (තෝරා) ගන්නෙහු ද?

فَلَوْلَا إِذَا بَلَغَتِ الْحُلْقُومَ {83}

(කෙනෙකුගේ ප්‍රාණය) උගුරු දණ්ඩට ළඟා වූ විට

وَأَنْتُمْ حِينَئِذٍ تَنْظُرُونَ {84}

නුඹලා එම අවස්ථාවේ බලමින් සිටින්නෙහුය.

وَنَحْنُ أَقْرَبُ إِلَيْهِ مِنْكُمْ وَلَٰكِنْ لَا تُبْصِرُونَ {85}

තවද ඔහු වෙත අපි නුඹලාට වඩා සමීපයෙන් වෙමු. නමුත් නුඹලා නොදකිනු ඇත.

فَلَوْلَا إِنْ كُنْتُمْ غَيْرَ مَدِينِينَ {86}

එහෙයින් නුඹලා වගකිව යුත්තන් නොවන්නෙහු නම්

تَرْجِعُونَهَا إِنْ كُنْتُمْ صَادِقِينَ {87}	(නුඹලා සිතන පරිදි) නුඹලා සත්‍යවාදීන් නම් නුඹලා එය නැවත ගෙන එනු.

88-91 දෙවියන්ගේ සමීපතයින්හට හිමි ප්‍රතිඵල හා දකුණුපස ජනයාට හිමි ප්‍රතිඵල.

فَأَمَّا إِنْ كَانَ مِنَ الْمُقَرَّبِينَ {88}	එහෙයින් ඔහු (අල්ලාහ්ට) සමීපතයින් අතුරින් වූයේ නම්
فَرَوْحٌ وَرَيْحَانٌ وَجَنَّتُ نَعِيمٍ {89}	සැනසුම ද ප්‍රණීත ආහාර ද සැපවත් (ස්වර්ග) උයන් ද වෙති.
وَأَمَّا إِنْ كَانَ مِنْ أَصْحَابِ الْيَمِينِ {90}	ඔහු දකුණු පස ජනයා අතුරින් වූ කෙනෙකු වූයේ නම්
فَسَلَامٌ لَكَ مِنْ أَصْحَابِ الْيَمِينِ {91}	එසේ නම් දකුණු පස ජනයා අතුරින් වූ ඔබට ශාන්තියයි.

92-96 නොමග ගිය බොරුකාරයින්හට හිමි අවසන් ඉරණම.

وَأَمَّا إِنْ كَانَ مِنَ الْمُكَذِّبِينَ الضَّالِّينَ {92}	ඔහු නොමග ගිය බොරු කරන්නන් අතුරින් වූයේ නම්
فَنُزُلٌ مِنْ حَمِيمٍ {93}	එවිට ලෝ දියෙන් වූ නවාතැනකි.
وَتَصْلِيَةُ جَحِيمٍ {94}	තවද නිරා ගින්නෙහි දැවීමකි.
إِنَّ هَٰذَا لَهُوَ حَقُّ الْيَقِينِ {95}	ස්ථිර සත්‍යය වනුයේ නියත වශයෙන්ම මෙයමය.
فَسَبِّحْ بِاسْمِ رَبِّكَ الْعَظِيمِ {96}	එහෙයින් නුඹගේ අතිමහත් වූ පරමාධිපතිගේ නාමයෙන් සුවිශුද්ධ කරනු.

IslamHouse.com